# පුස්දිවුල්වැව උපභාෂාව : වාග්විද්‍යාත්මක විග්‍රහයක්

ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණයේ ඒකදේශ අවශ්‍යතාවක්
සපුරාලීම් වශයෙන් ඉදිරිපත් කෙරෙන නිබන්ධනය යි.

කැ ල ණි ය වි ශ් ව වි ද්‍යා ල ය

1 9 8 3

55

ආර්.එම්.ඩබ්ලිව්. රාජපක්ෂ

## සාරසංග්‍රහය

මෙම නිබන්ධනයෙහි අරමුණ, විග්‍රහාත්මක වාග්විද්‍යාවෙහි නිර්දිෂ්ට විධිනියමවලට අනුකූල ව පුස්දිවුල්වැව සිංහල උපභාෂාව පිළිබඳ ව වාග්විද්‍යාත්මක විග්‍රහයක් ඉදිරිපත් කිරීමයි. මෙය පරිච්ඡේද හතරකින් සමන්විත වේ.

1. පරිච්ඡේදය - ශබ්දිම විචාරය

මේ යටතේ ඛණ්ඩය ශබ්දිම, අධිඛණ්ඩය ශබ්දගත ලක්ෂණ, වර්ණ සංස්ථිතිය සහ ද්‍රැත-විලම්බිත උච්චාරණය පිළිබඳ කරුණු සාකච්ඡා කෙරේ.

2. පරිච්ඡේදය - සන්ධි විචාරය

මෙහි දී සන්ධි යනුවෙන් අදහස් කෙරෙන්නේ පදිම - ශබ්දිම විකල්පනයි. අභ්‍යන්තර සන්ධි, බාහිර සන්ධි සහ එකී සන්ධි විධි ආශ්‍රයෙන් කෙරෙන ශබ්දිම වර්ගීකරණය පිළිබඳ කරුණු මෙම පරිච්ඡේදයෙහි අන්තර්ගත වේ.

3. පරිච්ඡේදය - පදිම විචාරය

නාම වචන, ක්‍රියා වචන, විශේෂණ වචන සහ අව්‍යය වචන මෙහි දී විග්‍රහ කෙරේ.

4. පරිච්ඡේදය - විශේෂතා

බස්නාහිර උපභාෂාව සමඟ සැසඳීමේ දී පුස්දිවුල්වැව උපභාෂාවේ ප්‍රමුඛ ව කැපී පෙනෙන විශේෂතා මෙහි දී සාකච්ඡා

කෙරේ. ශබ්දිම සහ පදිම පද්ධතීන්හි දක්නට ලැබෙන විශේෂතා වලට වඩා නිඝණ්ඩුමය විශේෂතා සාපේක්ෂක ව වැඩි ය.

මෙබඳු උපභාෂා විචාර රටෙහි සංවර්ධනය සඳහා කෙතරම් දුරට අදාළ වේ ද යනු පරිශිෂ්ටයෙහි සාකච්ඡා කෙරේ. පොදුවේ විග්‍රහාත්මක වාග්විද්‍යාවෙහි විෂයක්ෂේත්‍රයේ ව්‍යාප්තිය පුළුල් වීම් වශයෙන් ද විශේෂයෙන් සිංහල භාෂාවෙහි උපභාෂාගත කරුණු එක් රැස් කිරීම් වශයෙන් ද මෙම නිබන්ධනය වැදගත් ශාස්ත්‍රීය කරුණු එකතුවක් වෙයි.

ABSTRACT

This dissertation presents a Linguistic analysis of PUSDIVULVEVA dialect of Sinhala [1] within a structural frame work. It covers the following aspects:

Phonological structure touching mainly upon the segmental phonemes, supra-segmental features, syllable structure rules and such aspects as tempo-variation.

Morphoponemics, mainly discussed under External and Internal Sandhi, in the light of which a structural classification of the phonemes is presented.

Morphological Analysis of the main word classes, discussed under the Nouns, Verbs, Adjectives and Uninflectables.

The main contrasts specially in phonology and lexicon, between this dialect and the Sinhala dialect spoken around Colombo ~~and~~ and its suburbs.


---

1. see Dialect map, page

The significance of dialect studies of this type for National development finds discussion in the Appendix.

In general this is a contribution in the fields of linguistics, and specially in the field of Sinhala linguistics and dialectology.

23 MAY 1984